ස්වදේශ කටයුතු චක්‍රලේඛ : 08/2019

මගේ අංකය : HAF - 1/5/විවිධ

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

නිදහස් චතුරශ්‍රය

කොළඹ 07.

2019.03.27 දින

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>දිස්ත්‍රික් පරිපාලනයේ සහ ප්‍රාදේශීය පරිපාලනයේ සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරීන්ගේ පහසුකම් වැඩිදියුණු කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් අංක අමප/19/0726/114/015 හා 2019.03.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී ඇති අනුමැතිය අනුව 2019.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් තීරණ ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වමි.

i. රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලිපි අංක එච්ඒ/ඩීඒ/5/දීමනා/2 සහ 1993.04.29 දිනැති ලිපියට අනුව දැනටමත් ගෙවනු ලබන සංග්‍රහ දීමනාව, යෝජිත වියදම් සීමාව තුළ බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමේ පදනමින් පහත සඳහන් පරිදි වැඩි කර ඇත.

| | | |
|---|---|---|
| a. | දිස්ත්‍රික් ලේකම් සඳහා | - රු.15,000/- |
| b. | අතිරේක දිස්ත්‍රික් ලේකම් සඳහා | - රු.10,000/ |
| c. | ප්‍රාදේශීය ලේකම් සඳහා | - රු.10,000/- |
| d. | සහකාර ප්‍රදේශීය ලේකම් සඳහා | - රු.5,000/- |

ii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 13/2008 (IV) යටතේ ගෙවනු ලබන ඉන්ධන දීමනාව, ඉහත තීරණය අනුව දිස්ත්‍රික් ලේකම් සඳහා ලීටර් 250 ක් ලෙසත්, අතිරේක දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් සඳහා ලීටර් 170ක් ලෙසත් අනුමත කර ඇත.

- ❖ නමුත් විවිධ විෂයන් යටතේ විවිධ ආයතන වලින් ඔබ වෙත ලබා දෙන ඉන්ධන වල එකතුව ඉහත සඳහන් උපරිමයට වඩා වැඩි නොවිය යුතුය.

iii. ප්‍රාදේශීය ලේකම් සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ තනතුරට ගැලපෙන පරිදි නිවසක් ලබා දීම සඳහා එක් එක් ප්‍රාදේශීය බල ප්‍රදේශයන්හි තක්සේරුගත නිවාස කුලියට සමාන වන නිවාස දීමනාවක් ලබා දීම, තවද නිවාස දීමනාව ලබා දීමේ දී සෑම විටම රජයේ නිල නිවසක් සපයා දී නොමැති විට පමණක් අදාළ දීමනාව ලබාදිය යුතු අතර, නිවාස දීමනාව ලබා ගන්නා නිලධාරීන් අදාළ නිවාස තුළ පදිංචිව සිටීම ද අනිවාර්ය විය යුතුය.

එච්.ටී.කමල් පත්මසිරි

ලේකම්

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය. - කරු.දැ.ගැ.ස
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය. - කරු.දැ.ගැ.ස
3. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
4. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.